# සංචාරක කර්මාන්තයෙන් යැපෙන

# 'රිටිපන්න'ය අනතුරේ...!



දකුණු වෙරළ තීරයේ ගාලු පාර ඔස්සේ ගමන් කොට ඇති ඔබගේ දෑසට නිතැතින්ම මුණගැසී ඇති ඉහත ඡායාරූප වල ඇති ධීවරයන් හඳුන්වන්නේ රිටි පන්න ධීවරයන් (stick fishermen) කියාය.

නොගැඹුරු සාගරයේ රිටක් මත නැගී කාස්ටක අව්වේ බිලී පිත්තක්ද අතැතිව සිටිනා එම ධීවරයන් ඇස ගැසෙනා යමෙකු හට තවමත් අප රටේ ධීවර තාක්‍ෂණය රැඳී ඇත්තේ මෙතරම් නොමේරූ ප්‍රාථමික අඩියක දැයි සිතේ නම් ඔහුද වැරදී නැත.

එනමුත් දඹානේ වන්නිලෑ ඇත්තෝ තවමත් කොළඹ පැමිණෙන්නේ ද කෙටේරිය තම උරහිසේ රඳවාගෙන ය. එසේම රිටි පන්න ධීවරයා හටද තම කර්මාන්තයේ යෙදිය යුතුව ඇත්තේ ඊට අනුගත ස්ථානයේ නියමිත ඉවියව්වේ සිට සුපුරුදු මෙවලම අතැතිව ය.

ඊට හේතුව දඹානේ ආදිවාසීන් මෙන්ම රිටි පන්න ධීවරයා සහ එම ක්‍රමවේදය ද අපගේ සංරක්‍ෂණය විය යුතු ධීවර ජීවනෝපාය මාර්ග අතරින් ඉපැරණිම එකක් වන නිසා ය.

එනමුත් අද ''විසිදැල''හි දිග ඇරෙන්නේ එහි සොඳුරු පැති කඩක් නොවේ.

අපගේ ආදිවාසීන් සේම අපගේ රිටි පන්න ධීවර ශිල්පීන් ද අද ප්‍රමුඛ පෙළේ සංචාරක ආකර්ශණයක් වී ඇති බව සාක්‍ෂාත් වන්නේ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව ඇති සියලුම සංචාරක වෙබ් අඩවි වල පාහේ මුල් රූපය සරසා ඇත්තේ රිටි පන්න ධීවරයකු ගේ සුපුරුදු ඉරියව්වේ ඡායාරූපයක්ද සමග වන නිසා ය.

එබැවින් අද සංචාරක කර්මාන්තය මතින් යැපෙනා කර්මාන්තයක් බවට පත්ව ඇති රිටි පන්න ධීවර කර්මාන්තයේ සැබෑ රිද්මය සොයා අප පිය මැන්නේ අහංගම හාත පැළෑණ ප්‍රදේශයේ දිවිගෙවනා රිටි පන්න ධීවරයන් මුණගැසීමට ය.

ඒ පිළිබඳව ප්‍රථමයෙන්ම අදහස් දැක්වූයේ රිටි පන්න ධීවර කර්මාන්තයේ දී යොදා ගන්නා තාක්‍ෂණික ක්‍රමවේදයන් පිළිබඳව ද අවබෝධයක් ඇති අජන්ත අල්විස් ධීවර මහතා ය.

ඈත අතීතයේ සිටම පැවතගෙන එන රිටිපන්න ධීවර ක්‍රමය ගාල්ල කතලුවේ ඉඳන් මාතර පොල්හේන ධීවර කලාපයේ හැර ලංකාවේ කිසිම ප්‍රදේශයක දකින්නත් නැහැ.

රිටි පන්න ධීවර ක්‍රමයේදී වැඩිපුරම අහුවෙන්නේ බෝල්ලා සිරිඹුරුවා කියන මාලු දෙවර්ගයයි. එම මාලුන් අල්ලන්න අවශ්‍ය ඊයම් බිලීය හදා ගන්නෙත් අපිමයි.



ඒ බිලී කොක්ක හදා ගන්න සුදු ඊයම් වානේ වැල් ඕනෑ වෙනවා. වානේ වැල් දැලිපොතු (දැල්ලා ගේ සිරුරේ ඇතුලත ඇති විනිවිද පෙනෙනා පොත්ත) මට්ටමට කපලා අච්චුව හදා ගන්නවා. ඊට පස්සේ ඊයම් බිලියේ අච්චුව ගහලා ලෙවල් කරලා උණු කරපු ඊයම් වානේ වැල් ගාණට කපලා තියලා බිලී කටු දහයක් පහළවක් වගේ එක සැරේ දිගට අච්චුවේ වක්කරනවා. ඉන් පස්සේ බිලී කටුව ගාණට තලලා උල් කරලා පීරෙන් ඔප මට්ටම් කරලා ලස්සන හැඩේ එන්න රෝල් කරලා හූරලා තමයි රිටි පන්න බිලී කටුව නිමා කර ගන්නේ.

මෙය තනිකරම අපේ පැරැන්නෝ දේශීය ව හදා ගනිපු බිලී කටු වර්ගයක්. මෙ බිලී කටු වර්ග දෙකක් තියෙනවා. පස් ඊයම් බිලී කටු වෙනයි. සුදු ඊයම් බිලී කටු වෙනයි. මේ මගේ අතේ තියෙන්නේ පස් ඊයම් බිලී කටුව. මේක තමයි බෝල්ලෝ අල්ලන්න අරගන්නේ.

මේ ඊයම් බිලී කටු හදන්න මම අපේ ලොකු අය්යාගෙන් ඉගෙන ගත්තේ. අපේ තාත්තාගෙන් තමයි අය්යා ඉගෙන ගෙන තිබුණේ.

රිටි පන්න බිලි පිත්ත හදා ගන්නේ කපාගෙන ආපු අමු කිතුල් පිත්තක් අව්වේ වේලලා සුද්ද කරලා කිසියම් ප්‍රමිතියකට අනුවයි. ඒවගේම මේ මුහුදේ හිටවලා තියෙන රිට, එහෙමත් නැත්නම් කනුව මුහුදු වතුරට ටික කළක් වත් ඔරොත්තු දෙන්න ඕනෑ නිසා ඇට්ටෝනියා නැත්නම් කඩොල් කියන වර්ගයේ ලීයක් තමයි අරගන්නේ. ඒ ලීය මුහුදු පතුලේ හිටවලා වාඩිවෙන්න ආධාරකයක් බඳිනවා ට කියන්නේ පෙති බඳිනවා ය කියලයි...''

ඉන් පසුව අදහස් දැක්වූ රිටි පන්න ධීවරයන් වන ලයනල්, මාටින්, ආරියරත්න, රංජි, යන රිටි පන්න ධීවරයන් එම කර්මාන්තයේ වර්තමාන තත්වය හෙළි කළේ මෙසේ ය.

අපේ ගමේ රිටි පන්න ධීවර පවුල් 35 ක් තියෙනවා. ඒ සියලු දෙනා 'සැනසුම' කියන රජයේ අනුමත ධීවර සමිතියක් වටා එකමුතු වෙලයි ඉන්නේ. පහුගිය දවස්වල ඒ ධීවර සමිතියට පාස් වුනේ පුස් බයිසිකල් තුනක් විතරයි. ඉතින් කොහොමද බයිසිකල් තුනක් සමිතියේ සමාජිකයෝ තිස් පහක් අතරේ බෙදන්නේ. මොන පදනමින් බෙදුවත් අවුල් ඇතිවෙනවා නේද?.

අද අපට තියෙන ප්‍රධාන ගැටලුව අල්ලන්න මුහුදේ මාලු නැති කම යි. මිරිස්ස පැළෑණ පැත්තේ දැල්පටි ගහන නිසා (පටි දැල් යනුවෙන් නම්කර ඇති දැල් වර්ගයකින් ධීවර කර්මාන්තයේ යෙදෙන නිසා) දැන් ගොඩට ඇදෙන්න තරම් මාලුවක් නෑ. මාලු හිඟයි. වඳ වේගනයි යන්නේ. දැල්පටි ගහන අය හුරුල්ලෝ දැල්ය කියලා දැම්මාට ඊට ගොඩාක්ම කුඩා මාලුත් ඒ පොඩි සිදුරු දැල් වලට අහුවෙනවා. ඒ නිසයි රිටි පන්න ක්‍රමයෙන් අල්ලන්න මුහුදේ මාලු නැත්තේ. මාලු හිඟ නිසා මේ රස්සාවෙන් ජීවත් වෙන්න බැරි තත්වයකුයි අපට දැන් ඇති වෙලා තියෙන්නේ.





මීට අවුරුදු 15 කට විතර උඩදී අපි මුලු අවුරුද්දේ මාස දොළහේම මෙතන මාලු බෑවා. නමුත් දැන් එහෙම බාන්න මාලු නෑ. දැන් දැල් වර්ගත් වැඩියි. මුහුදට බැහැපු පිරිසත් වැඩියි. එදාට අනුව බැලුවාම දැන් සියයට හැත්තෑවකින් අපේ මාලු අස්වැන්න අඩුයි.

දැන් ඉතින් සුද්දන්ට පොටෝ ගහන්න පෙනී ඉඳලා කීයක් හරි හොයා ගන්න තැනටයි අපි වක්‍රව වැටිලා ඉන්නේ. ඒ නිසා බලධාරීන්ගෙන් ඉල්ලන්නේ රිටි පන්න ක්‍රමයත් අපිත් ආරක්‍ෂා කරලා දෙන්න කියලයි. ඉන්පසුව අදහස් දැක්වූ අනුර අල්විස් වික්‍රම(47) රිටි පන්න ධීවර කාර්මිකයා මෙසේ පැවසී ය.

මම අවුරුදු 17 ඉඳලයි මෙ රිටි පන්න ධීවර කර්මාන්තය කරන්නේ. කියන්න කණගාටුයි සුද්දෝ නැත්නම් මෙ රිටි පන්න කර්මාන්තය මෙලහකටත් සහ මුලින්ම අතුගෑවිලා ගිහිල්ලා. රටින් එන සුදු මහත්තුරු, නෝනලාට පින්සිද්ද වෙන්න තමයි අද අපි මේ කර්මාන්තෙන් ජීවත් වෙන්නේ. එදා අපි රිටිපන්නෙන් විතරයි ජීවත් වුනේ. නමුත් කරන්න දෙයක් නෑ. අද අපට සුද්දන් ඉදිරියේ ප්‍රදර්ශණ භාණ්ඩ බවටත් පත්වෙන්න සිදුවෙලා තියෙනවා.

අපේ පොටෝ අරගන්න සුදු මහත්තුරු හරි කැමතියි. සුදු මහත්තුරු එක්ක එන සමහරක් ගයිඩ් මහත්තුරු අපිට සුද්දෝ සල්ලි දෙනවට කැමති නෑ. සුදු මහත්තුරු අපිට වැඩි මුදලක් දෙන්න හැදුවත් ඒ වගේ ගයිඩ් ලා කියනවා ඔච්චර දෙන්න එපාය රුපියල් සීයක් විතර දුන්නාම ඇතිය කියලා. ඒ උදවිය අපේම රටේ සිංහල උදවිය වීමයි තියෙන කණගාටුව. ඊට වඩා පිටරට සුද්දෝ හොඳයි. නමුත් හැම ගයිඩ් මහත්තයාමත් එහෙම නෑ.







සමහර ගයිඩ් මහත්තුරු අපට කෙලින්ම කියනවා. පොටෝ ගහන්න වාහනෙන් බස්සන්නම් හැබැයි රුපියල් සීයට වැඩිය ගන්න එපා ය කියලා. ඒ ඉල්ලීම හරි අසාධාරණයි. මොකද ඒ සුදු මහත්තුරු අපේ පොටෝ අරගෙන ගිහිල්ලා ශ්‍රී ලංකාවේ නමින් ඒ ඡායාරූප, වීඩියෝ විවිධ වැඩ සටහන් වලට පාවිච්චි කරලා ඩොලර් දහස් ගණනින් උපයනවා ඇති. නමුත් ඡායාරූපෙට පෙනී සිටිනා අපට රුපියල් සීයට වැඩිය ගන්න එපාය කියන එක හරි අමානුෂිකයි.

සමහර දවසට ලොකු බස් වලින් සුදුමහත්තුරු පාටි ආපුවාම අපි දහ දොළොස් දෙනෙක් රිටි කනු වලින් බස්සලා අපිත් එක්ක එකට ඉඳලා පොටෝ ගහලා ගයිඩ් මහත්තයාගේ කීම පැත්තක ට දාලා සුද්දො ම එකතු කරලා අපට රුපියල් පන් දාහක් හය දාහක් වගේ දෙන දවස් තියෙනවා. එහෙම ලැබුණු දවසට අපි ධීවරයෝ කට්ටියම සමානව සල්ලි බෙදාගෙන ගෙදරට විශේෂ කෑමක් බීමක් එහෙම අරගෙන යනවා.

රිටි පන්න ධීවර ක්‍රමය ගැන කොරියන් රටේ උදවිය ගොඩාක් උනන්දුයි. එයාලා දකුණු පළාතේ සංචාරයට ආවොත් අනිවාර්යෙන්ම අපේ පොටෝ අරගන්නවා. කොරියන් රටේ සුද්දෝ රිටි පන්න ක්‍රමය ගැන ගොඩාක් දේ ලියලා තියෙනවා. ඒ සඟරාවල් අපි දැකලත් තියෙනවා....'' යනුවෙනි.

ඉන් පසුව අදහස් දැක්වූයේ හාත පැළෑණ අහංගම ධීවර ගම්මානයේ ධීවරයන් විසින් අල්ලනු ලබන මාලුන් අළෙවිකොට දිවිය සරි කර ගන්නා කාන්තාවක වන එස්. ඩබ්. එම්. රංජනී (49) මහත්මියයි.

''... අපේ ගමේ රිටි පන්න වලින් අල්ලන මාලු මම තමයි පාර අයිනේ තියාගෙන ඉඳලා යාන වාහන වලින් යන නෝනලා මහත්තුරුන්ට ඒවා විකුණන්නේ. පළාතේ කිසිම බලධාරියකුගෙන් අපේ රිටි පන්න කර්මාන්තෙට ලැබෙන සහයෝගය ගැන අපට කොහෙත්ම සතුටු වෙන්න බෑ.

උදාහරණයක් හැටියට මගේ බාල මල්ලිගේ පවුලයි ළමයි දෙන්නම සුනාමියෙන් මියගියා. එයාට තිබුණු බෝට්ටුවත් පදිංචි වෙලා ඉඳපු ගෙදරත් සුනාමියෙන් විනාශ වුනත් ඒවට හරි හමන් ආධාරයක් වත් ලැබුණේ නෑ.

අපේ පවුලේ හය දෙනෙක් ම සුනාමියට ගියා.

එකම පෙට්ටියේ දාලා පවුලේ පස්දෙනෙක් එකම දවසේ මිහිදන් කරලයි අපි මෙ ඉන්නේ. ඒ වේදනාවල් තවම හදවත් වලින් මැකිලා ගිහින් නෑ....

ඒ නිසා අපිට නැතිවෙන්න දෙයක් නෑ. කොහොමටත් හෙට අනිද්දා අපි මේ මුහුද අයිනේ පාරේ යන ලොකු මහත්තුරුන්ට පේන්න ලොකු බැනර් එකක් දාන්නයි ඉන්නේ.... රිටි පන්නයෙන් දිවි ගෙවන අපේ අපේ දුක ගැන කියලා....''

අහංගම හාත පැළෑණ රිටි පන්න ධීවර කාර්මිකයන්ගේ සැබෑ හඬ එයයි.

''...දිරියෙන් නැගී සිටින්නා හට දිය යුත්තේ මාලුවකු නොව බිලී පිත්තකි...''යි යන සනාතන සත්‍යයක් තිබේ.

ඒ මත හෝ පිහිටා බලධාරීන් විසින් ඔවුන් හට ''පුස් බයිසිකල්'' වලට එහා ගිය, ඔවුන් නඟා සිටුවීමේ වැඩ පිළිවෙළකට යාම ඇඩි අවශ්‍යතාවයක් ව ඇත්තේ මුලු ලංකාවේ ම සිටිනුයේ ධීවර අමාත්‍යාංශයේ ලියාපදිංචි රිටිපන්න ධීවරයන් සියයක පමණ සංඛ්‍යාවක් වන නිසා ය.

ඒය අද අපගේ නිගමනය වූ බව ''විසිදැල '' හි සටහන් කොට තබන්නේ අනාගතයේ දී වැලලී යන පෙර නිමිති පළකරනා රිටි පන්න ධීවර කර්මාන්තය වෙනුවෙන් ''විසිදැල'' තැබූ සටහනක් ලෙස ය.

සටහන හා ඡායාරූප -
**රන්ජන් ගාමිණී ජයවර්ධන**
ඡායාරූප විස්තරය
**අජන්ත අල්විස්**